# مختصر شرح ألفاظ الأذان (للجمعية)

# අදාන්හි වදන්වල සංක්ෂිප්ත විග්‍රහය

# අදාන්හි වදන්වල සංක්ෂිප්ත විග්‍රහය

විවිධ භාෂා සඳහා වූ ඉස්ලාමීය අන්තර්ගත තොරතුරු පිළිබඳ සේවා සංගමයේ අධ්‍යයන කමිටුව

# අදාන්හි වදන් විග්‍රහය

විවිධ භාෂා සඳහා වූ ඉස්ලාමීය අන්තර්ගත තොරතුරු පිළිබඳ සේවා සංගමයේ අධ්‍යයන කමිටුව

අදාන් යනු දිනකට පස් වරක් මුස්ලිම්වරු සවන් දෙන දිව්‍යමය ඇරයුමකි, එය ඔවුන්ට අල්ලාහ්ගේ මහිමාන්විතභාවය මතක් කරවමින් යහපත් කටයුතු හා විජයග්‍රහණය වෙත ආරාධනා කරයි. එය මිනිසා හා ඔහුගේ නිර්මාතෘ අතර සම්බන්ධතාවයක් ඇති කරවන නිමේෂයකි. එහි දී ඔහු කලබලකාරී ලෝකයෙන් දුරස් ව සිය පරමාධිපතියාණන් සමඟ සංවාදයක නිරත වේ.

උසස් අරුත්වලින් බරිත මෙකී අදානය අල්ලාහ්ගේ මහිමාන්විත ශ්‍රේෂ්ඨත්වය විදහා පාමින් ආරම්භ වී, සලාතය සඳහා වූ ඇරයුමෙන් අවසන් වන්නකි. මෙහි දී මුස්ලිම්වරයා සිය සැනසුම සොයා ගනු ඇත.

අදාන්හි වදන් පෙළ මෙසේ ය:

"අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්." (අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ ය (4 වරක්))

අල්ලාහු අක්බර්

කීර්තිමත් නාමය වන: 'අල්ලාහ්' යනු නැමදුම් ලැබීමට සුදුස්සා හා මැවුම්කරු වූ පරමාධිපතියාණන්ගේ නාමය යි. උතුමාණන්ගේ සියලු ම උත්තුංග නාම උතුමාණන්ට ගැළපෙන අතර ඒවා උතුමාණන්ගේ විශේෂිත වර්ණනා ය. අල්ලාහ් ඒකීයවන්තයා ය; ඔහුට කිසිදු දරුවෙක් නැත; ඔහු කිසිවෙකුගෙන් උපත ලැබූවෙක් ද නොවේ; උතුමාණෝ

අහස් සහ මහපොළොවේ මැවුම්කරුවාණෝ ය.

"අල්ලාහු අක්බර්" යන වචනයේ අර්ථය වන්නේ, අල්ලාහ් සියලු දෑට වඩා අතිශය කීර්තිමත්, මෙන් ම ඔහුගේ මහිමාන්විතභාවය හා පූර්ණත්වය සඳහා නොගැළපෙන කිසිවක් ඔහුට සම්බන්ධ නොකළ යුතු යි යන්න වේ.

අල්ලාහු අක්බර්... මෙම වැකිය මුස්ලිම්වරයෙකුට මතක් කර දෙන්නේ, මෙම ජීවිතයේ කිසිදු දෙයක් තම මැවුම්කරුගෙන් තමන්ව ඈත් නොකළ යුතු බවයි. මිනිසා තම ජීවිතය මෙහෙයවිය යුත්තේ තමාගේ ආශාවන් හෝ හැඟීම් අනුව නොව, අල්ලාහ්ගේ කැමැත්ත සහ ධර්මයට (ෂරීආවට) අනුකූලවය. මන්ද, මෙලොව ඇති සියලු දේට වඩා අල්ලාහ් ශ්‍රේෂ්ඨය.

අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, අෂ්හදු

අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්,

(නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව මම සාක්ෂි දරමි. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව මම සාක්ෂි දරමි.)

අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්,

මෙය පළමු ෂහාදා (සාක්ෂිය) වන අතර, එහි අර්ථය වන්නේ: අල්ලාහ් සියලු දේ මැවූ මැවුම්කරු බවත්, සියල්ලේ අධිපතියා, පාලකයා සහ මෙහෙයවන්නා ඔහුම බවත් පිළිගැනීමයි. ඔහු හැර වෙනත් කිසිවෙකු වන්දනාමාන කිරීමට සුදුසු නොවන බවත්, සැබෑ ලෙසම නැමදුම් ලැබිය යුත්තේ ඔහු පමණක්ම බවත් මෙයින් අදහස් කෙරේ. ඔහු ඒකීයය, ඔහුට සහකරුවෙකු නැත, දරුවෙකු නැත, ඔහුට සමාන කළ හැකි කිසිවෙකුද නැත. එබැවින්, අල්ලාහ් හැර වෙනත් කිසිවෙකුට වන්දනාමාන නොකළ යුතු අතර අල්ලාහ් හැර වෙනත්

කිසිවෙකුගෙන් (දුආ) පිහිට නොපැතිය යුතුය.

මෙම ෂහාදාව ලෝකයේ පවතින ශ්‍රේෂ්ඨතම සාක්ෂියයි. එය සියලු දිව්‍යමය දූත මෙහෙවරයන්හි (ධර්මයන්හි) විශ්වාසයේ පදනම වේ. නූහ්, ඉබ්‍රාහීම්, මූසා සහ ඊසා සිට මුහම්මද් ﷺ දක්වා වූ සියලුම අල්ලාහ්ගේ දූතවරුන් (නබිවරුන්), 'අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත' (ලා ඉලාහ ඉල්ලල්ලාහ්) යන සත්‍යය පිළිගැනීමට සහ විශ්වාස කිරීමට තම ජනයාට ඇරයුම් කළහ.

අල්ලාහ් මැවීම් නිර්මාණය කළේත්, දූතවරුන් එවා එම සත්‍යය තහවුරු කළේත්, ආගමික ග්‍රන්ථ පහළ කර එය පැහැදිලි කළේත් මෙම ප්‍රකාශය උදෙසාමය. තවද, තම හදවතින්ම අවංකව මෙම සාක්ෂිය රැගෙන එන (පිළිගන්නා) අයට ප්‍රතිලාභයක් ලෙස ඔහු ස්වර්ගය උරුම කර දුන්නේය.

මිනිසුන්ව මරණයෙන් පසු නැවත නැඟිටුවනු ලබන්නේත්, මළවුන් කෙරෙන් නැගිටින දිනයේදී ඔවුන්ව විනිශ්චයට ලක් කරනු ලබන්නේත් මෙම ප්‍රකාශය (ලා ඉලාහ ඉල්ලල්ලාහ්) වෙනුවෙනි. එබැවින්, කවුරුන් මෙම සත්‍යය මත ජීවත් වී, තම ජීවිතයේ අවසාන මොහොතේද මෙය ප්‍රකාශ කරමින් සමුගන්නේද, ඔහු උදාර වූ ජයග්‍රහණය අත්කර ගත්තේය. නමුත්, කවුරුන් මෙය ප්‍රතික්ෂේප කර, එය ප්‍රකාශ නොකර සිටින්නේද, ඔහු නිරයේ සදාකාලික දඬුවමට සුදුස්සෙකු වන්නේය.

"අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්, අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්."

සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයෙකු බව මම සාක්ෂි දරමි. සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයෙකු බව මම සාක්ෂි දරමි.

"අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්"

මෙම සාක්ෂි දැරීමේ අර්ථය නම්, අල්ලාහ් මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ව අවසාන දේව දූතයා ලෙසත්, මිනිසුන් වෙත දේව පණිවිඩය සන්නිවේදනය කරන්නා ලෙසත් එවා ඇති බවට මුස්ලිම්වරයෙකු සාක්ෂි දැරීමයි. තවද, අල්ලාහ්ට නැමදුම් කිරීමට සහ ඔහුගේ ප්‍රසාදය දිනා ගැනීමට ඇති එකම මාර්ගය වන්නේ මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් දේව දූතයාණන් ලෙස පිළිගැනීම, එතුමාණන්ව අනුගමනය කිරීම, ආදර්ශයට ගැනීම සහ එතුමාණන් දේශනා කළ දිව්‍යමය නීතියට (ෂරීආවට) අනුව අල්ලාහ්ට නැමදුම් කිරීම පමණක් බව මුස්ලිම්වරයෙකු ස්ථිරවම විශ්වාස කළ යුතුය.

එමෙන්ම මෙම සාක්ෂි දැරීමට ඇතුළත් වන තවත් කරුණක් නම්, එතුමාණන්ට පෙර සිටි ඉබ්‍රාහිම්, මූසා සහ ඊසා (ඔවුන් කෙරෙහි ශාන්තිය අත්වේවා) යන

නබිවරුන් සිදු කළාක් මෙන්, මුහම්මද් නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ද පැමිණියේ මිනිසුන්ව ඒක දේව වාදය (තව්හීද්) වෙත නැවත කැඳවීමට බවයි. එතුමාණන් ලෝකයාගේ අධිපතිගේ දූතයා වන අතර, සියලුම දේව දූතයන් තම ස්වාමියාගේ පණිවිඩ සන්නිවේදනය කිරීමේදී ගමන් කළ එම මාවතේම එතුමාණෝ ද ගමන් කළහ. කෙසේ වෙතත්, එතුමාණන්ගෙන් පසුව තවත් නබිවරයෙකු (දේව දූතයෙකු) නොමැත.

"හය්ය අලස් සලාහ්, හය්ය අලස් සලාහ්"

සලාතය වෙත පැමිණෙන්න. සලාතය වෙත පැමිණෙන්න

"හය්ය අලස් සලාහ්"

මෙම ප්‍රකාශයේ අර්ථය: අහෝ! විශ්වාසවන්තයිනි, ඔබගේ පරමාධිපතියාණන් නමදින්නට යොමු වන්න. මන්ද, ඔහු අතිශයින්ම සමාව

දෙන්නා වූද, මහා කරුණාවන්තයා වූද කෙනෙකි. ඔහු පශ්චාත්තාපය (තව්බා) පිළිගන්නා අතර පව්කම්වලට සමාව ලබා දෙයි.

මෙය දේවත්වය විශ්වාස කරන මුඃමින්වරුන්ට සලාතය තුළ තම ස්වාමියා ඉදිරියේ පෙනී සිටීමට කාලය එළඹ ඇති බවට ඇරයුම් කරනු ලබන කැඳවීමක් සහ මතක් කර දීමකි.

"හය්ය අලල් ෆලාහ්, හය්ය අලල් ෆලාහ්"

ජයග්‍රහණය වෙත පැමිණෙන්න, ජයග්‍රහණය වෙත පැමිණෙන්න

"හය්ය අලල් ෆලාහ්"

ජයග්‍රහණය යන්නෙහි, මෙලොවෙහි මෙන්ම මතු ලොවෙහි තෘප්තිය, සාර්ථකත්වය, ආරක්ෂාව හා මිදීම ඇතුළත් වේ.

තවදුරටත් එහි අර්ථය වනුයේ අල්ලාහ්ගේ තෘප්තිය දිනා ගැනීම, ස්වර්ගයට පිවිසීම සහ අපා ගින්නේ සිට

ගැලවීමයි. මක්නිසාදයත් කවරෙකු විශ්වාස කර සලාතය ස්ථාපිත කළේ නම් ඔහු ජය ලැබීය, ජය ලැබූ කවරෙකු වී නම් ඔහු ජයග්‍රහණය ලබා ස්වර්ගයේ සදාකාලිකත්වය දිනා ගනු ඇත.

"අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, ලා ඉලාහ ඉල්ලල්ලාහ්"

අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ ය, අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ ය, නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත.

මෙසේ අල්ලාහ්ට ශ්‍රේෂ්ඨත්වය පුදකරමින් හා ඔහුගේ ඒකීයත්වය ප්‍රකාශ කරමින් අවසන් කරයි.

අදාන් (සලාතය සඳහා කැඳවීම) අවසන් වන්නේ 'අල්ලාහු අක්බර්' (අල්ලාහ් සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨයි) යන වැකිය නැවත ප්‍රකාශ කිරීමෙන් සහ 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත) යන්න තහවුරු කිරීමෙනි. මෙම වැකි දෙක මගින් පෙර සඳහන් කළ අර්ථයන්

තවදුරටත් තහවුරු කරන අතර, මානව පැවැත්මේ කේන්ද්‍රය වන්නේද මෙයයි. කාලය කෙතරම් ගත වුවද, සිදුවීම් කෙතරම් සිදු වුවද මෙම සත්‍යය කිසිදා වෙනස් නොවේ. එනම්, අල්ලාහ් දෙවිඳුන් සෑම දෙයකටම වඩා ශ්‍රේෂ්ඨ බවත්, ඔහු සැබෑ වූ එකම දෙවියා බවත්, වන්දනාමාන ලැබීමට සුදුසු එකම තැනැත්තා ඔහු පමණක් බවත්, ඔහු හැර අන් කිසිවකුට නැමදුම් කිරීම නිෂ්ඵල (බාතිල්) ක්‍රියාවක් බවත්ය.

අවසාන වශයෙන්: අදාන් (සලාතය සඳහා කැඳවීම) යනු හුදෙක් සලාතය සඳහා කරන ආරාධනයක් පමණක් නොවේ. එය සාර්ථකත්වය, ජයග්‍රහණය සහ විමුක්තිය සඳහා කරනු ලබන කැඳවීමකි. එය හදවත් අවදි කරවීමටත්, අල්ලාහ් දෙවිඳුන් අපට ඉතා සමීප බව මතක් කර දීමටත්, දිනකට පස් වතාවක් මස්ජිද්වලින් දෝංකාර දෙන පණිවිඩයකි.

ඔබේ හදවත ඊමාන් හෙවත් විශ්වාසය සදහා විවෘත කරන්න, 'නැමදුම් ලබන්නට සුදුසු අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවට මම සාක්ෂි දරමි, මුහම්මද් නබි තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් බවට මම සාක්ෂි දරමි' (අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, ව අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්) යනුවෙන් පවසන්න. එවිට ඔබ අල්ලාහ්ගේ කරුණාවට ඇතුළත් වන අතර, මෙලොවදී සතුටත්, මතු ලොවදී ගැලවීමත් අත්කර ගනු ඇත. එමෙන්ම විනිශ්චය දිනයේදී ඔබව විශ්වාසවන්තයන්ගේ (මුඃමින්වරුන්ගේ) කණ්ඩායම සමඟ නැවත නැගිටුවනු ලබනු ඇත.

# පටුන

අදාන්හි වදන්වල සංක්ෂිප්ත විග්‍රහය .......................................... 2
අදාන්හි වදන් විග්‍රහය ........................................................................ 2

si504v1.1 - 06/09/2026